ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 04 ක අවසන් ශේෂයන්, 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (SA- 82) ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී රු.70,978,258 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2023 වර්ෂයේ SA 82 නව සිගාස් වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව තාක්‍ෂණික දෝෂයක් හේතුවෙන් එහි අගයන් නිවැරදිව දක්වා නොතිබුණු බව.	නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ස්ථාවර වත්කම් වාර්තාව (SA-82) හා සාරාංශ වාර්තාව (SA-80) අතර ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, ඉඩම් හා කෙරීගෙන යන වැඩ යනාදී ස්ථාවර වත්කම්වල වර්ෂය තුළ එකතු කිරීම් හා ඉවත් කිරීම්වල එකතු වටිනාකම පිළිවෙලින් රු.69,602,451 ක හා රු.2,587,807 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	SA80 වාර්තාවෙන් භාණ්ඩාගාර මුද්‍රිත ශේෂයන් වෙනස් වීම හේතුවෙන් එය නිවැරදි කිරීම සඳහා ජ්නල් සටහන් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති බව.	නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. .
(ඇ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාව (SA-82) සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කම් සංචලන වාර්තාව අතර යන්ත්‍ර හා උපකරණ , කෙරීගෙන යන වැඩ යන ස්ථාවර වත්කම් අයිතමවල වර්ෂය තුළ එකතු කිරීම්, වර්ෂය තුළ ඉවත් කිරීම්, ආරම්භක ශේෂ සඳහා ගැලපීම් හා හුවමාරු යන එකතු වටිනාකම් අතර පිළිවෙලින් රු.2,609,563 ක, රු.2,230,075 ක, රු.188,542 ක හා රු.83,257 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	SA80 වාර්තාවෙන් භාණ්ඩාගාර මුද්‍රිත ශේෂයන් වෙනස් වීම හේතුවෙන් එය නිවැරදි කිරීම සඳහා ජ්නල් සටහන් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති බව.	නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.

(ඇ)	විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ බණ්ඩාරගම, බේරුවල, කළුතර, පාලින්දනුවර හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විගණනයට ඉදිරිපත් කළ 2024 වර්ෂය සඳහා වූ ස්ථාවර වත්කම් අයිතම ලැබීම් වාර්තාවට අනුව ශේෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලැබූ ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට අනුව ශේෂය අතර එකතුව රු.8,169,048 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	පිළිතුරු ලබාදී නොතිබුණි.	නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	බණ්ඩාරගම, කළුතර, බේරුවල හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ප්ලාස්ටික් පුටු 12 ක්, ලැප්ටොප් පරිගණක 02 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 01 ක්, ඇල්මා කබඩ් 02 ක්, ස්කැනර් 01 ක්, CPU 01 ක් මොනිටර් 01 ක්, තාපෝලියන් ෂීට් 03 ක් සහ සෝලා විදුලි බල්බ 43 ක් ස්ථාවර වත්කම් සංචලන වාර්තාවට අතුළත් කර නොතිබුණු අතර, එම ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්ගත කර නොතිබුණි.	පිළිතුරු ලබාදී නොතිබුණි.	ගිණුම්ගත නොවූ ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමට හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	පිරිවැය රු.12,680,000 ක් වූ කළුතර දිස්ත්‍රික් ලේකම් නිල නිවස හා පිරිවැය විගණනයට ලබා දී නොතිබුණු මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ලේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයටත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.	කළුතර දිස්ත්‍රික් ලේකම් නිල නිවස 2025 වර්ෂයේ දී CIGAS වෙත ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව හා මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කිරීම සඳහා 2025 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව.	ගිණුම්ගත නොවූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයට අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය පාලනය හා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක වනු ලබන අතර වරින් වර තවදුරටත් වැඩි දියුණු කල යුතු පද්ධතීන් හඳුනා ගෙන ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද අලුතින් හදුන්වා දීම, පොදු උපදෙස් ලිපි මඟින්, ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ රැස්වීම්, විගණන කමිටු රැස්වීම් වැනි විවිධ අවස්ථා වල සිදු කරන අතර ඉදිරියේදී තවදුරටත් වැඩි දියුණු කල යුතු පද්ධතින් හඳුනා ගෙන ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද හඳුන්වා දීමට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	whatsapp,email වැනි ක්‍රම මඟින් පිළිතුරු ලබා ගැනීමට කටයුතු කර නොපමාව පිළිතුරු යැවීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන			
(i) XIX පරිච්ඡේදයේ 5.3.2 ඡේදය	අදාළ නිලධාරියාගේ වැටුපෙන් තක්සේරුගත නිවාස කුලී අයකර ගැනීම් කල යුතු වුවද ඉංගිරිය හා බණ්ඩාරගම සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් නිවාස කුලී වෙනුවෙන් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගත යුතු රු.331,065 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.	තවදුරටත් අය කර ගත යුතු ශේෂය රු.331,065 ක් බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අදාළ නිලධාරියාගේ වැටුපෙන් තක්සේරුගත නිවාස කුලී අයකර ගැනීම කළ යුතු අතර එලෙස කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ii) XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක මාස 01 ත් වසර 8 ත් අතර කාලයකට පෙර මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුට අදාළ එකතුව රු.741,373 ක ණය ශේෂයක් අදාළ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර නොතිබුණි.	මෙම ණය ශේෂ අතරින් එක් ණය ශේෂයක් වාරික වශයෙන් ලැබෙමින් පවතින බව හා අනෙකුත් ණය ශේෂ අදාළ නිලධාරීන්ගේ මරණ පාරිතෝෂික ලැබුණු පසු අයකර ගන්නා බව.	හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට නීතිරීති ප්‍රකාරව කටයුතු කර ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමටත් කටයුතු කිරීම.
(iii) XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.5, 4.6 හා 6.3	නිලධාරියා විශ්‍රාම ගොස් මාස 03 කට වැඩි කාලසීමාවක් ගත වී තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක අය කර නොගත් එකතුව රු.597,689 ක ණය ශේෂ 04 ක් පැවතුණි.	මේ අතරින් ඇතැම් ණය ශේෂ වාරික වශයෙන් අයවෙමින් පවතින බව.	- එම -

(iv) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6	කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ තහනම් කරන ලද, එක් නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.184,030 ක ණය ශේෂයක් පැවතුණි.	මාසිකව රු.2000 බැගින් වාරික වශයෙන් අයවෙමින් පවතින බව.	- එම -
(v) XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක තනතුර හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.445,495 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානයටත් විධිවිධාන ප්‍රකාරව අය කර ගෙන නොතිබුණි.	මේ අතරින් ඇතැම් ණය ශේෂ වාරික වශයෙන් අයවෙමින් පවතින බව.	- එම -
(ආ) මුදල් රෙගුලාසි 880 හා 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 දරන ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය	ඇප තැබිය යුතු යැයි නියමකර ඇති රජයේ සියලුම නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක එලෙස ඇප තැබියයුතු නිලධාරීන් 53 දෙනෙකු විසින් චක්‍රලේඛ ප්‍රකාරව තැබිය යුතු රු.447,000 ක ඇප වටිනාකමින් කිසිදු මුදලක් තැන්පත් කර නොතිබුණු අතර තවත් නිලධාරීන් 17 දෙනෙකු විසින් එලෙස තැබිය යුතු ඇප වටිනාකමට වඩා රු.87,098 ක් අඩුවෙන් තැන්පත් කර තිබුණි.	ඇප තැන්පතු මුදල් අයකිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ඇප තැන්පත් ලබා ගත යුතු අතර, අනුකූලතාවය නොදක්වන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුය.
(ඇ) 2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ලබන විශ්‍රාමිකයන් සඳහා මසකට රු.3,500 ක අන්තර් දීමනාව නොගෙවිය යුතු වුවද, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයෙකු සඳහා එලෙස රු.3,500 ක මාසික දීමනාව ගෙවා තිබීම හේතුවෙන් රු.280,000 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	වැඩිපුර උපදෙස් ලබා ගැනීම සඳහා විශ්රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.

(ඇ)	2016 පෙබරවාරි 25 දිනැති අංක 3/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 ජුනි 11 දිනැති අංක 01/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ට ගැලපූ විශ්‍රාම වැටුපක් නැවත විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2019 අනුව සංශෝධනය කිරීම අවශ්‍ය නොවුණ ද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් 06 දෙනෙකු සඳහා එලෙස විශ්‍රාම වැටුප නැවත සංශෝධනය කර 2019 ජූලි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා ගෙවා තිබීම හේතුවෙන් රු.1,636,902 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	ගොනුවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට කටයුතු කරන බව.	- එම -
(ඉ)	2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 06 ඡේදය	මියගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත පානදුර, බේරුවල, හොරණ හා කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2024 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 51 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.1,748,003 ක මුදලක් පැවතුණි.	අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතිණ බව	චක්‍රලේඛ ප්‍රකාරව ලේඛන යාවත්කාලීන නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඊ)	2019 ජුනි 11 දිනැති අංක 14/2019 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමෙන් අනතුරුව මෙතෙක් ගෙවූ අන්තර් දීමනාව නතර කළ යුතු වුවද සන්නද්ධ සේවා/ පොලිස් වැන්දඹු විශ්‍රාම වැටුප් චක්‍රලේඛයට අනුව ගැලපීමෙන් පසුව ද වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ ඒකාබද්ධව ගෙවනු ලබන යැපීම් දීමනාව සඳහා වූ අන්තර් දීමනාව 2019 ජූලි මස සිට 2024 දෙසැම්බර් මාසය දක්වාම විශ්‍රාමිකයින් 04 දෙනෙකු සඳහා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබීම හේතුවෙන් රු.1,254,000 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	අයකර ගැනීමට කටයුතු කරමින් පවතිණ බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.

(උ)	2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පානදුර, කළුතර, හොරණ, පාලින්දනුවර, වලල්ලාවිට, මතුගම හා බේරුවල, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 269 ක් 2024 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි.	ගොනු කිහිපයක් සංශෝධනය කර ඇති බවත්, ඉතිරි ගොනුවල පවතිණ ලේඛනවල අඩුපාඩු සම්පූර්ණ වූ වහාම සංශෝධනය කිරීමට කටයුතු කරන බව.	කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, චක්‍රලේඛ ප්‍රකාරව විශ්‍රාම වැටුප් ලිපිගොනු සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඌ)	2019 ජූලි 26 දිනැති අංක 01/2019 දරන සංශෝධන II විශ්‍රාම වැටුප් චක්‍රලේඛය	ත්‍රිවිධ හමුදා මඟින් ගෙවනු ලබන වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයන්ට 01/2019 වැටුප් සංශෝධනය අදාළ නොවන බව දක්වා තිබිය දී එලෙස හමුදා වැටුප් ලබන එක් විශ්‍රාමිකයකුගේ වැටුප 01/2019 චක්‍රලේඛයට අනුව සංශෝධනය කර 2019 ජූලි මස සිට 2024 දෙසැම්බර් මස දක්වාම පානදුර ප්‍රාදේශීය කාර්යාලය විසින් ගෙවා තිබීම හේතුවෙන් රු.301,277 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.	කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(එ)	2019 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	විගණන නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 ක් සතු වාහන 06 කට සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු එක් වාහනයකට අදාළව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳව කාලීන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	වාහන 4 කට අදාළ ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇති අතර, අනෙක් වාහනවලට අදාළ ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව වාහනවලට අදාළව ඉන්ධන දහන පරීක්ෂාවන් කාලීනව සිදු කළ යුතුය.

(ඒ)	2021 සැප්තැම්බර් 29 දිනැති අංක PFD/PMD/Cir/ 2021/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය			
	(i) 2.1 හා 2.3 ඡේද	චක්‍රලේඛයේ සඳහන් කරුණුවලට පටහැනිව 2024 වර්ෂයේදී කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ලබාදී තිබූ ප්‍රජා මූල සංවිධාන පිළිබඳව ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ප්‍රජා මූල සංවිධාන සම්බන්ධයෙන් වෙනම ලිපිගොනු පවත්වා ගෙන ගොස් නොතිබුණු බව.	විගණනය විසින් ඉල්ලා සිටින ලිපිගොනු කඩිනමින් ලබා දීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.
	(ii) 2.5 ඡේදය	පවරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රජා පාදක සංවිධානයේ/ සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුළ විය යුතු වුවද කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති බල ප්‍රදේශ සීමාවෙන් පිටත ප්‍රජා පාදක සමිති වෙත ද ලබා දී තිබුණි.	සමෘද්ධි සමිති විසින් වසමෙන් පිටත සමිති තෝරාගැනීමට විරෝධතාවයක් නොමැති බව ප්‍රකාශ කර ඇති බව.	චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී චක්‍රලේඛයට අනුගත වීමත් කළ යුතුය.
(ඔ)	2022 නොවැම්බර් 29 දිනැති මහජන ආරක්ෂක අමාත්‍යාංශ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 06 දරන චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ලියාපදිංචි කර ඇති ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන මඟින් වාර්ෂිකව ලබා දිය යුතු ලේඛන දක්වා තිබුණු අතර සෑම සංවිධානයකටම අදාළව එම තොරතුරු වාර්ෂිකව ලබාගෙන සංවිධානයේ මුල් ගොනුවට ඇතුළත් කලයුතු වුවද නියැදි පරීක්ෂාවට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන 05 කට අදාළව සමාලෝචිත වර්ෂයේ තොරතුරු එලෙස යාවත්කාලීන කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවල තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.

3.3 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.233,307,842 ක ශේෂයක් පැවති අතර ඒ අතුරින් පොදු තැන්පත් ගිණුම් 3 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු.10,787,728 ක තැන්පතු ශේෂයක් පැවතුණි. එසේම එකී ශේෂය තුළ එකතුව රු.1,235,951 ක් වූ වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ද පැවති අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි.	මේ අතරින් කල් ඉකුත්වූ තැන්පතුවලින් කොටසක් පසුකාලීනව නිරවුල් කර ඇති බව හා නිරවුල් නොවූ තැන්පතු මෙම වසරේ නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	කල් ඉකුත් වූ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම හා ප්‍රගතිය ඇගයීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගෙන නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත් කර තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඇතැම් අංශවල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන කාර්යසාධන දර්ශක කිසිවක් ඉදිරිපත් කර නොතිබුණු අතරම ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරිපත් කර තිබුණු ඇතැම් අංශවල අපේක්ෂිත ඒකකය, භෞතික/ මූල්‍ය ඉලක්ක ප්‍රතිදානය, ප්‍රතිඵලය හා වගකිව යුතු නිලධාරී යන ක්ෂේත්‍රයන් සඳහන් කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලසුම්වලට අනුගතව ඉදිරිපත් කර නොතිබීම	ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන් දීමේ නිලධාරී වෙතින් අනුමත කරවා ගැනීමට මෙම වර්ෂයේදී පියවර ගන්නා බව. අපේක්ෂිත ඒකකය, භෞතික/ මූල්‍ය ඉලක්ක, ප්‍රතිදානය, ප්‍රතිඵලය අදාල අංශ වෙතින් ලබා ගත යුතු වූ නිසා එහිදී යම් ප්‍රමාදයක් සිදුවූ බැවින්, අදාල අංශ මඟින් ඉදිරිපත් කළ ආකාරයෙන්ම විගණනය වෙත ඉදිරිපත් කල බව. 2025 වර්ෂයේදී ප්‍රගති වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුගතව පමණක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	ක්‍රියාකාරී සැලැස්ම විධිමත්ව සකස් කර නියමිත කාල සීමාවේදී අනුමත කරවා ගැනීමත්, ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තා කාලීනව සැකසීමත් කළ යුතුය.

හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය මැන බැලීම සිදු කළ නොහැකි විය.

4.1.2. කමිටු ක්‍රියාකාරිත්වය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන විවිධ කමිටු අතරින් කමිටු 05 ක ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු ආශ්‍රයෙන් සිදු කළ පරීක්ෂාවේ දී සෑම මසකට ම වරක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, පරිසර කමිටුව සහ ඩෙංගු මර්දන කමිටුව රැස් විය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එය වාර 04 ක් පමණක් රැස් ව තිබුණු අතර, වසරක් තුළ 03 වරක් රැස් විය යුතු දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව වසර තුළ රැස් වී තිබුණේ එක් වරක් පමණක් විය. තවද වසරක් තුළ මසකට වරක් බැගින් පැවත්විය යුතු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ද සමාලෝචිත වර්ෂය තුළ රැස් වී තිබුණේ වාර 06 ක් පමණක් විය. ඒ අනුව දිස්ත්‍රික්කය තුළ ඵලදායී, අර්ථවත් සේවාවක් පුරවැසියන් වෙත සැපයීම සඳහා යෝජිත කමිටුවල නිසි හා කාලීන ක්‍රියාකාරිත්වය අතිශය වැදගත් වන නමුත් එම කමිටුවල කාලීන ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් විසින් 2024 වර්ෂය සඳහා රැස්වීම් දින ලබා දීම රැස්වීම් වාර 04 කට පමණක් සිදු කළ බැවින්, කමිටුව මාසිකව රැස්වීමට කටයුතු සිදු නොකළ බව හා 2024 වර්ෂයේ ප්‍රධාන මැතිවරණ දෙකක් පැවැත්වීම මත නිලධාරීන් මැතිවරණ රාජකාරි කටයුතුවල නිරතවීම හා කමිටු පැවැත්වීම සඳහා ශ්‍රවනාගාර පහසුකම් නොමැති වීම හේතුවෙන් කමිටු පැවැත්වීමට බාධාවක් වූ බව.	දිස්ත්‍රික්කය තුළ ඵලදායී, අර්ථවත් සේවාවක් පුරවැසියන් වෙත සැපයීම සඳහා යෝජිත කමිටුවල නිසි හා කාලීන ක්‍රියාකාරිත්වය අතිශය වැදගත් වන බැවින් එම කමිටු නියමිත පරිදි පැවැත්විය යුතුවේ.

4.2 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන රු.500,000 ක් මත "යොවුන්ගම" ප්‍රජාශාලාවේ වර්ග අඩි 500 කට ආසන්න ප්‍රමාණයක් කොන්ක්‍රීට් යෙදීම, ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම, දොර ජනේල අලුත්වැඩියාව, ජනෙල් සඳහා උළුවහු යෙදීම ආදී ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර තිබූ අතර මෙලෙස රජයේ ප්‍රතිපාදන යොදා අලුත්වැඩියා කරන ලද ප්‍රජා ශාලාවේ වහල අධික ලෙස දිරා ගොස් කඩා වැටීමට ආසන්නව පැවතුණි. මෙලෙස අලුත්වැඩියාවට ලක් කරන ලද ගොඩනැගිල්ල සහ භූමියේ නිරවුල් අයිතිය පවා පැහැදිලිව හඳුනාගෙන නොතිබුණු අතර එලෙස අයිතිය පවා හඳුනාගෙන නොමැති වහලය කඩා වැටීමට ආසන්න ගොඩනැගිල්ලක් අලුත්වැඩියා කිරීම සඳහා රජයේ අරමුදල් යොදවා තිබුණි. ඉහත තත්ත්වයන් ප්‍රදේශයේ සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී පවා ලිඛිතව පෙන්වා දී තිබූ තත්ත්වයක් තුළ මේ සඳහා අරමුදල් යෙදවීමට අනුමැතිය ලබා දී තිබුණු අතර මෙම ගොඩනැගිල්ල සහිත භූමිය ද අධික ලෙස වල් බිහිවී ඌන උපයෝජිතව පැවතුණි.	මෙම ගොඩනැගිල්ල සහිත භූමිය ඌන උපයෝජිතව පැවතිය ද අනපේක්ෂිත ගැටළු මතු නොවූයේ නම් ගොඩනැගිල්ල ඵලදායී කාර්යයන් සඳහා උපයෝජනයට හැකියාව පැවති බව හා 2025 පළාත් සභා ප්‍රතිපාදන මගින් ගොඩනැගිල්ලේ වහලය සැකසීමට අපේක්ෂිත බව.	විධිමත් අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය තෝරාගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීමේදී ආර්ථිකමය ඵලදායීතාවය සහ ප්‍රමුඛතා අනුපිළිවෙල කෙරෙහි සැලකිලිමත් වීමත් කළ යුතුය.
(ආ)	2014 වර්ෂයේ "පළාත් නැගුම" සංවර්ධන වැඩසටහන යටතේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදලින් රු.7,500,000 ක් හොරණ රාජ්‍ය ඔසුසල ඉදිකිරීම සඳහා වෙන්කර එම ගොඩනැගිල්ල 2016 වර්ෂයේ දී රු.7,075,000 ක ඇස්තමේන්තු පිරිවැයකින් ඉදිකිරීම් නිම කල ද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අපේක්ෂිත අරමුණ සඳහා භාවිතයකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සම්බන්ධිත පාර්ශවයක් වූ ඖෂධ නීතිගත සංස්ථාව සමග ඉදිකිරීම් සැලසුම් සම්බන්ධයෙන් එකඟතාවක් නොවීම සහ දෙපාර්ශවය අතර ඉඩම් පවරා ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව සිදුකළ යුතු නීතිමය අවශ්‍යතා සම්බන්ධව පැවති ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මේ වන විට ඉදිකිරීම් අවසන් කර වසර 08 ක් පමණ කාලයක් ගතවී තිබුණ ද මෙම ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවති අතරම නිසි උපයෝජනයක් හා නඩත්තු කිරීමක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.	මෙම ගොඩනැගිල්ල ඌන උපයෝජිතව අභාවයට යමින් තිබූ බැවින් අදාළ ආයතනවල එකඟතාවය විමසා ක්ෂේත්‍ර නිලධාරීන් 04 දෙනෙකුගේ කාර්යාල සඳහා භාවිතා කරමින් පවතින බව.	අදාළ සම්බන්ධිත පාර්ශව සම්බන්ධීකරණය කර අරමුණුගත කාර්යයට ගොඩනැගිල්ල යෙදවීමට කටයුතු කිරීමත්, ව්‍යාපෘතියක් ආරම්භයේ සිට අවසානය දක්වාම සම්බන්ධිත රාජ්‍ය ආයතන අතර නිසි සම්බන්ධීකරණයක්, මෙහෙයවීමක් හා අධීක්ෂණයක් පවත්වාගෙන යාමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය.

(ඇ)	ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් "ග්‍රාම ශක්ති" ජනතා වැඩසටහන යටතේ නියැදි පරීක්ෂාවට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අදියර දෙකක් යටතේ සමිති 57 ක් ලියාපදිංචි කර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 45 ක් එනම් සියයට 79 ක්ම අක්‍රීයව පැවති බැවින් එදිනට එම සමිතිවල බැංකු ගිණුම්වල පැවති රු.21,821,998 ක මුදලක් ඌන උපයෝජිතව පැවතුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක එකී ක්‍රියාකාරීව පැවති සමිතිවල සාමාජිකයින් හට ලබා දී තිබූ ස්වයංරැකියා ණය අතරින් රු.1,566,845 ක් 2024 දෙසැම්බර් 31 දිනට අය නොවූ අක්‍රීය ණය වශයෙන් පැවතුණි. චක්‍රලේඛ ප්‍රකාරව සක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල ව්‍යවස්ථාවට අනුව විධායක සභාව කැඳවා අදාළ වසම භාර සංවර්ධන නිලධාරීගේ සම්බන්ධීකරණයෙන් ප්‍රජා සංවර්ධන කටයුතු ආරම්භ කළ යුතු බව දක්වා තිබුණ ද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. දෙවැනි අදියර ග්‍රාම ශක්ති සමිති සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වැය කිරීම පිළිබඳ වූ චක්‍රලේඛයට අනුව අක්‍රීය මට්ටමේ පවතින ග්‍රාම ශක්ති සමිතිවල ප්‍රතිපාදන මුදල් සක්‍රීය මට්ටමේ පවතින සමිතිවලට ලබාදීමට කටයුතු කල යුතු වුවද කාලීනව ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලිපියට අනුව, බැංකු ගිණුම්වල ඌන උපයෝජිත මුදල් දිස්ත්‍රික් ලේකම් පොදු තැන්පතු ගිණුමට යෙදවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇති බව. අක්‍රීය සමිති සම්බන්ධයෙන් අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සෞභාග්‍යා කාර්යාංශයට ලිපි ලේඛන යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව.	විධිමත් වැඩපිළිවෙලක් යොදා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සමිති සක්‍රීය කර ක්‍රියාත්මක කිරීම හෝ අක්‍රීය සමිතිවල මුදල් ශේෂ රජයට පවරා ගැනීම හෝ කළ යුතුය.

4.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ඔලබොඩුව බිම්මල් වගාව ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.7,795,419 ක් වැයකර තිබුණි. 2024 සැප්තැම්බර් 30 දිනට ප්‍රතිලාභීන් 14 දෙනෙකු විදේශ ගත වීම, පදිංචිය මාරු කිරීම වැනි විවිධ හේතු මත උක්ත කර්මාන්තයෙන් බැහැර වී හෝ තාවකාලිකව කර්මාන්තය නවතා දමා තිබුණු අතර, තවත් ප්‍රතිලාභීන් 12 දෙනෙකු වෙත ලබා දී තිබූ	මෙම ව්‍යාපෘතියට වෙන් කර ඇති මුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම අපේක්ෂා කළ ද රටේ පැවති කොරෝනා වසංගතය, ආර්ථික අර්බුදය නිසා භාණ්ඩ හා සේවාවල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාම, ප්‍රතිලාභීන්ගේ අරමුණු බිඳවැටීම මත ඔවුන් අධෛර්යමත් වීම සහ නැවත	විධිමත් පරිදි ව්‍යාපෘතිය අධීක්ෂණය හා පසු විපරම් සිදු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා

	භාණ්ඩ හා උපකරණ ද ඌන උපයෝජිතව පවතිණ නමුත් එම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ද චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ බිම්මල් නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථාන 02 ක් පෞද්ගලික ඉඩම් 02 ක ස්ථාපනය කර තිබූ අතර, එහි පොදු පරිහරණය සඳහා බිම්මල් මාධ්‍ය මිශ්‍ර කිරීමේ හා පැකට් කිරීමේ යන්ත්‍ර සහ බිම්මල් තම්බන යන්ත්‍ර 01 බැගින් ස්ථාපනය කර තිබුණි. මෙම පොදු පහසුකම් මධ්‍යස්ථාන හා ඒ සඳහා සපයා දී තිබුණු යන්ත්‍ර හා උපකරණද ආරම්භක අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඌන උපයෝජිතව පැවති අතර උක්ත ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම, නිර්දේශ කිරීම, අනුමත කිරීම සිදු කිරීමේ දී අදාළ ව්‍යාපෘතියේ පොදු මධ්‍යස්ථානවල අවශ්‍යතාවය හා උපයෝජනය පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු කර ඒ අනුව ව්‍යාපෘති සැලසුම් සකස් කර නොතිබුණි.	සවිබල ගැන්වීම අපහසුවීම වැනි ගැටළු රාශියක් නිසා අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වී ඇති බව.	මෙහෙයවීම සිදු කළ යුතු අතර, ඉදිරියේදී නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතුය.
(ආ)	හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන - 2021 යටතේ එළවළු, පලතුරු හා කොළ වර්ග විජලනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සෞභාග්‍යා සමිතියට එකතුව රු.5,845,504 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ද, සමිතියේ සාමාජිකයින්ට තනි පුද්ගල ප්‍රදාන ලෙස එකතුව රු.614,240 ක උපකරණ ද ලබාදී තිබුණි. උක්ත ව්‍යාපෘතිය යටතේ ආහාර ද්‍රව්‍ය විජලනය කරනු ලබන ප්‍රධාන සැකසුම් මධ්‍යස්ථානය පෞද්ගලික ඉඩමක ස්ථාපනය කර තිබූ අතර එහි ඉහත යන්ත්‍ර හා උපකරණ ගිවිසුම්ගතවීමකින් තොරව ස්ථාපිත කර තිබුණි. ලබාදී තිබූ උපදෙස් මාලාවට අනුව පෞද්ගලික ගොඩනැගිලිවල පොදු මධ්‍යස්ථාන පිහිටුවීමට අදාළ කටයුතු කර ඇති අවස්ථාවල දී පොදු ස්ථානයක් සකස් කර ගන්නා තෙක් විධිමත් නීත්‍යානුකූල ක්‍රමවේදයක් හරහා ප්‍රාදේශීය ලේකම් හා අදාළ ඉඩමේ හිමිකරු සමඟ එකඟතාවයක් ඇති කර ගැනීම සිදු කළ යුතු වුව ද ඒ සඳහා එවැනි විධිමත් නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. පුද්ගලික සන්නම් නාමයක් යටතේ මෙහි නිෂ්පාදන ලේබල් කර තිබූ අතර, දැනට අලෙවිකරණ කටයුතු සිදුකරන්නේ සභාපති විසින් පමණක් වන බැවින් අලෙවිකරණ කටයුතු සඳහා සම්බන්ධ වන ලෙසට සාමාජිකයන්ගෙන් දිගින් දිගටම ඉල්ලා සිටියද ඔවුන් තවමත් ඒ සඳහා සම්බන්ධ නොවන අතර ඉබේ හටගන්නා කොස්,	ව්‍යාපෘතිය තවදුරටත් ගිවිසුම ප්‍රකාරව කරගෙන යාමේ හැකියාවක් නොමැති නම් අදාළ ව්‍යාපෘති උපකරණ ආපසු භාර දීමටත්, පුහුණුව සඳහා වැය වූ රජයේ මුදල් ආපසු ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ ව්‍යාපෘතිය භාරකරු දැනුවත් කර ඇති බව.	- එම -

	කොහිල ආදිය පමණක් සැපයීමට අමතරව ව්‍යාපෘතියට අවශ්‍ය පළා වර්ග වගා කරන ලෙසට දිගින් දිගටම සාමාජිකයින් වෙත දැනුම් දුන්න ද එහි සතුටුදායක ප්‍රතිඵලයක් ලැබී නොතිබුණි. ව්‍යාපෘතියේ යන්ත්‍ර උපරිම ලෙස භාවිතා නොකරන අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමටද නොහැකිව තිබුණි.		
(ඇ)	“සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන” වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ මණ්ඩගල කුරුඳු ගම්මාන ව්‍යාපෘතිය සඳහා කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සහ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා කුරුඳු පැළ හා කුරුඳු උපකරණ ලබාදීම වෙනුවෙන් රු.4,869,111 ක මුදලක් වැයකර තිබුණි. මෙහි ව්‍යාපෘති යෝජනාවට අනුව කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයේ අපේක්ෂිත නිෂ්පාදිතය ලෙස කුරුඳු කොළ හා පොතු භාවිතයෙන් තෙල් නිෂ්පාදනය පිළිවෙලින් මාසිකව බෝතල් 15 ක් හා 12 ක් ද වශයෙන් දක්වා තිබුණද මෙම කුරුඳු නිෂ්පාදන මධ්‍යස්ථානය ආරම්භ කර වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද මේ දක්වා නිෂ්පාදනය කර තිබුණේ කුරුඳු තෙල් බෝතල් 27 ක් පමණක් විය. තවද මෙම කුරුඳු තෙල් නිස්සාරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු 2024 පෙබරවාරි 10 දිනෙන් පසුව සිදුකර නොතිබුණි.	කුරුඳු තෙල් මිල අඩු වීමත් සමගම නිෂ්පාදනය අඩුවීම සිදු වූ බව.	- එම -
(ඈ)	“සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන” වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ දේශීය වෙළඳ පොළට අතිරේකව අපනයන වෙළඳ පොළ ඉලක්ක කර ප්‍රදේශයේ බුලත් වගාව ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේදී රු.7,356,259 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් මාසිකව තනි කණු ක්‍රමය යටතේ බුලත් අත් 938 ක් හා පාත්ති ක්‍රමය යටතේ බුලත් අත් 3600 ක් වශයෙන් මාසිකව බුලත් අත් 4538 ක් නිපදවීමට අපේක්ෂා කර තිබුණ ද ව්‍යාපෘති ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 89 දෙනා අතරින් ප්‍රතිලාභීන් 28 දෙනෙකු පමණක් බුලත් වගාවේ නිරතව සිටියද, එම ප්‍රතිලාභීන්ගෙන් තිදෙනෙකුගේ හැර අනෙක් සියළු ප්‍රතිලාභීන්ගේ අදායම රු.10,000 ට අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම ව්‍යාපෘතියේ ආරම්භක ප්‍රතිලාභීන් 89 න් 61 ක්ම ව්‍යාපෘති අරමුණෙන් බැහැරව වෙනත් බෝග වර්ග වගා කිරීමට යොමුවී තිබුණි.	බුලත් වගාව නිතරම බැක්ටීරියා රෝගවලට ගොදුරු වීම සිදුවන බැවින් වෙනත් බෝගවලට ප්‍රතිලාභීන් තාවකාලිකව මාරු වී ඇති බව.	- එම -

(ඉ)	“සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන” වැඩසටහන-(2021) යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා සමිතියක් වෙත වටිනාකම රු.150,000 ක් වූ විජලන යන්ත්‍රයක් ලබා දී තිබූ අතර, එය ලබා දුන් දිනයේ සිට වසර 2½ ක පමණ කාලයක් ප්‍රමාණවත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ කාන්තා සමිතියක ඉල්ලීම පරිදි 2024 ජූලි 15 වන දින එම සමිතියට ලබා දී තිබුණි. එසේ වුවද එම සමිතිය මගින් ද යන්ත්‍රයේ පැවති දෝෂ හේතුවෙන් එය භාවිතයට නොගන්නා බවද ඒ අනුව විජලන යන්ත්‍රය ලබාදීමේ අරමුණ වූ විජලන තාක්ෂණය උපයෝගී කරගෙන ආහාර කල් තබා ගැනීම තුළින් සාමාජිකයින්ගේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා දායක වීමට නොහැකි වී තිබුණි. අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සිදු කරනු ලැබූ මිල දී ගැනීම් නිසා මෙලෙස ව්‍යාපෘතිය යටතේ දරනු ලැබූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි.	මෙම යන්ත්‍රයේ පවතින සුළු දෝෂ සකස් කර ගනිමින් ප්‍රයෝජනයට ගත හැකි වෙනත් සමිතියක් සොයා නැවතත් එම විජලන යන්ත්‍රය ලබා දීමට කටයුතු කරන බව.	- එම -
(ඊ)	පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2021 “සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන” වැඩසටහන යටතේ රු.9,521,994 ක ඇස්තමේන්තුවක් සහිත පාවහන් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා 2021 වර්ෂය වෙනුවෙන් රු.7,374,853 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද රු.873,967 ක් පමණක් පාවහන් ව්‍යාපෘතිය සඳහා වැයකර තිබුණි. තවද 2023 වර්ෂය සඳහා ද මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.1,268,463 ක ප්‍රතිපාදන වෙන්කලද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම වර්ෂයේදී පාවහන් ව්‍යාපෘතිය සඳහා රු.376,057 ක මුදලක් පමණක් වැයකර තිබුණි. මේ අනුව ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන උපරිමයෙන් වැයවන පරිදි ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ වගකිවයුත්තන් අපොහොසත් වී තිබුණු අතර සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අපේක්ෂා කරන ලද අරමුණු ළඟා කර ගැනීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන තුළින් තම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා දායක කරගැනීම ප්‍රශස්ථ මට්ටමක නොපැවතුණි.	2021 සංශෝධිත ඇස්තමේන්තුව සමඟ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් නොමැති බැවින් සංශෝධනයන් අනුමත නොකළ බව හා 2023 වර්ෂයේ රට තුළ පැවති ආර්ථික ගැටළුකාරී තත්වයන් හේතුවෙන් පාවහන් නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් ඉල්ලුම් කරන ලද උපකරණ සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු සියයට 50 ක මුදල් ගෙවීමට ප්‍රතිලාභීන් අපොහොසත් වූ බව.	ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන පූර්ණව උපයෝජනය කර ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කලයුතු අතර වැඩසටහන යටතේ අපේක්ෂා කරන ලද අරමුණු ළඟා කර ගැනීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන තුළින් තම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා දායක කරගැනීම ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

(උ)	“කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන" යටතේ බේරුවල හා මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෘහාශ්‍රිත එළුවන් ඇති කිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් 09 දෙනෙකු වෙනුවෙන් රු.715,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත්, විගණන භෞතික පරීක්ෂාවලදී අනාවරණය වූ පරිදි එසේ ලබාගත් එළුවන් සහ පැටවුන් විවිධ රෝගාබාධවලට ගොදුරු වී මිය යාම, ලබා දී තිබූ සතුන් වෙනත් අය වෙත විකුණා තිබීම හා මිය ගිය සතුන් වෙනුවෙන් නියමිත පරිදි රක්ෂණ වන්දි ලබා නොගැනීම නිරීක්ෂණය වූ අතර, සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලවල නිර්දේශය ලබාගැනීම සහ පශු වෛද්‍ය නිලධාරියාගේ අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබුණ ද එම අධීක්ෂණය නිසි ලෙස සිදුව නොතිබුණු අතර, ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්ද ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් සිදු වී නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට අදාල ප්‍රතිලාභීන් හා පශු වෛද්‍ය කාර්යාල තවදුරටත් දැනුවත් කිරීමට හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	ව්‍යාපෘති නිර්නායකවලට පටහැනිව කටයුතු කර ඇති ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමටත්, පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සෑම අදියරකදීම ප්‍රාදේශීය පශු වෛද්‍ය අධිකාරීන්ගේ සම්බන්ධීකරණය, මගපෙන්වීම, මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඌ)	කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කර තිබූ තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා කිකිළි පැටවුන් ලබාදීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.594,000 ක් වැයකර තිබුණු අතර 2025 පෙබරවාරි මස 06 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති කිකිළි පැටවුන් 800 න් 136 ක ප්‍රමාණයක් මිය ගොස් තිබූ අතර, එය ලබාදුන් කිකිළි පැටවුන් සංඛ්‍යාවෙන් සියයට 17 ක ප්‍රමාණයක් විය. මේ අතුරින් ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත ලබා දී තිබූ කිකිළි පැටවුන් 20 දෙනෙකුගෙන් සියළුම පැටවුන් මිය ගොස් තිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන්ට කිකිළි පැටවුන් ලබා දීමේ දී වයස මාස 1½ ක් වයසැති පැටවුන් ලබා දී තිබූ අතර, විගණිත දිනය වූ 2025 පෙබරවාරි 06 දින වන විට කිකිළි පැටවුන්ගේ වයස මාස 06 ඉක්මවා ගොස් තිබුණ ද ප්‍රතිලාභීන් 24 දෙනෙකුට ලබා දුන් කිකිළි පැටවුන්ගෙන් මියගිය සතුන් හැර ඉතිරි සතුන්ගෙන් 199 දෙනෙකු මෙතෙක් බිත්තර නොදමන බව ද වැඩිදුරටත් නිරීක්ෂණය වූ අතර එය මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදුන් කිකිළි පැටවුන්ගෙන් සියයට 25 ක් විය. ඒ අනුව එම ව්‍යාපෘතියේ අරමුණ වූ “අඩු ආදායම්ලාභී ග්‍රාමීය ජනාතාවගේ ආර්ථිකය ඉහළ	ප්‍රතිලාභීන් දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා දී තිබිය දී ප්‍රතිලාභීන්ගේ නොසැලකිලිමත්භාවය නිසා සතුන් මිය යාම සිදු වුවද ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට කටයුතු කරන බව හා සංවර්ධන නිලධාරීන් ලවා අදාළ විටමින් වර්ග හා ආහාර වර්ග සතුන්ට ලබා දීම අධීක්ෂණය තුලින් බිත්තර නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කරන බව.	පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සෑම අදියරකදීම ප්‍රාදේශීය පශු වෛද්‍ය අධිකාරීන්ගේ සම්බන්ධීකරණය, මගපෙන්වීම, මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු අතර, ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාළ ආයතන සහාය ඇතිව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

	නැංවීමට ප්‍රමාණවත් දායකත්වයක් ලබාගැනීම" යන්න අපේක්ෂිත මට්ටමින් ඉටු වී නොතිබුණි.		
(එ)	"කඳුකර දශකය 2024 – 2033 දශවිධ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන" යටතේ ලද රු.මිලියන 02 ක ප්‍රතිපාදන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු පැලවත්ත පිටිගල මාර්ගයේ මිරිස්වත්ත දක්වා කොටසේ හමුදා කඳවුර සඳහා ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සකස් කර තිබූ රු.මිලියන 02 ක් වූ ඇස්තමේන්තුව අනුව මාර්ගයේ උපරිම දිග ආසන්න වශයෙන් මීටර් 300 ක් සහ උපරිම පළල මීටර් 4.5 ක් ලෙස දක්වා තිබුණ ද ඒ සඳහා ලබාගත් ස්ථානීය මිනුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වූ අනුමත කළ මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව යෝජිත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන පුද්ගලයන් සංඛ්‍යාව 95 ක් ලෙස ද පවුල් සංඛ්‍යාව 25 ක් ලෙස ද දක්වා තිබුණු නමුත්, විගණනය විසින් 2025 ජනවාරි 15 දින අදාළ මාර්ග ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ ස්ථානීය භෞතික පරීක්ෂාවේ දී අදාළ ව්‍යාපෘතියේ මාර්ග සංවර්ධන කටයුතු 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ පැලවත්ත හමුදා කඳවුරේ අභ්‍යන්තර මාර්ග සංවර්ධන කටයුතුවලට පමණක් සීමා වී තිබුණි. ඒ අනුව මාර්ග සංවර්ධනය පැලවත්ත යුධ හමුදා කඳවුර අභ්‍යන්තරයේ දිග මීටර් 100 ක මාර්ග කොටසක් සම්පූර්ණයෙන් අලුතින් ඉදිකිරීමට සහ පොදු නිලධාරී නිවස්නය දක්වා වූ දිග මීටර් 84 ක තවත් කොටසක මාර්ග අලුත්වැඩියාව සිදුකිරීමට පමණක් සීමා වී තිබුණි. මෙසේ යුධ හමුදා කඳවුර පිවිසුම් මාවත අලුත්වැඩියාව සඳහා ලද රු.මිලියන 02 ක ප්‍රතිපාදන මගින් ප්‍රාදේශවාසීන් විසින් ඉල්ලුම් කළ ප්‍රවේශ මාර්ගය වෙනුවට හමුදා කඳවුර අභ්‍යන්තර මාර්ග පමණක් සංවර්ධනය කිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 15 දින අදාළ කොන්ත්‍රාත්කරුට රු.1,114,510 ක් ගෙවා තිබූ අතර, ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සඳහා ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි අත්‍යාවශ්‍ය මාර්ග සංවර්ධනය කරනු වෙනුවට හමුදා කඳවුරු අභ්‍යන්තර මාර්ග පමණක් සංවර්ධනය කර තිබීම තුළින් ප්‍රදේශවාසීන් සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීමේ තත්ත්වයක් උද්ගත වී තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් යටතේ ලැබෙන ප්‍රතිපාදන ප්‍රදේශයේ ජනතාව වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබෙන පරිදි ප්‍රමුඛතා පදනමක් යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, එසේ කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය.

4.4 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළදී කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි පිවිසුම අභියස ප්‍රධාන විදුලි පුවරුවෙහි සිදු වූ හදිසි ගිනි ගැනීම හේතුවෙන් ගොඩනැගිල්ලේ කොටස්වලට හා ප්‍රධාන විදුලි පුවරුව ආශ්‍රිතව සමස්ථ විදුලිබල පද්ධතිය සම්පූර්ණයෙන්ම හානියට පත්වීම නිසා සිදු වූ සමස්ථ හානියේ වටිනාකම රු. 7,500,000 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර තිබුණු අතර මු.රෙ. 104 (4) වාර්තාවට අනුව හානියට වගකිවයුතු පාර්ශවය ලෙස ලංකා විදුලි (පෞද්ගලික) සමාගම තීරණය කර ඒ බව ඔවුන් වෙත දැනුම් දී තිබුණි. එසේ වුවද ගිනි ගැනීමට හේතුව ලෙසට විමර්ශන මගින් හෙලිදරව් කර තිබුණු Bus-bar පැනලය තම සමාගම සතු වූවක් නොවන බවට එම සමාගම පවසා තිබූ අතර හානි ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් කිසිදු එකගතාවයක් ද දක්වා නොතිබුණි. එමෙන්ම අදාළ ගිනි ගැනීම සිදු වී 2025 අගෝස්තු මස 15 දින වන විට වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ලේ හානියට පත් විදුලි සැපයුම ස්ථාවරව යළි ලබා ගැනීමට හෝ එක් මසක කාලසීමාවකට පමණක් යෝග්‍ය වන පරිදි තාවකාලිකව ලබා දුන් විදුලි සැපයුම යථාවත් කිරීමට නොහැකිවී තිබුණි.	ගොඩනැගිල්ල ගිනි ගැනිමට හේතු වූ Bus-Bar පැනලය ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට අයත් දේපලක් වන බවට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ඇති බව. ඒ අනුව නොපමාවම සමාගමේ වියදමින් ස්ථාවර විදුලි සැපයුම යථාවත් කිරීමට පියවර ගන්නා මෙන් දැනුම් දි ඇති අතර රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශයේ ලේකම් මඟින් මුදල් අමාත්‍යාංශය දැනුවත් කිරීමටද පියවර ගෙන ඇති බව.	සිදුවූ හානියේ වටිනාකම වගකිවයුතු පාර්ශවයන්ගෙන් නොපමාව අයකරගෙන විදුලි පද්ධතිය ස්ථාවරව යථාවත්කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථයක් 2025 මාර්තු මස 12 දින බේරුවලට ආසන්න ප්‍රදේශයක දී දුම්රියේ ගැටීමෙන් අනතුරට ලක්වී තිබුණි. එසේ වුවද අනතුර සිදු වී විගණිත දිනවූ 2025 ජූලි 12 දිනට මාස 04 ක් ගත වී තිබුණ ද මේ සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පරීක්ෂණ පවත්වා රජයට සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ උපදේශක ආයතනයේ තොරතුරුවලට අනුව කොන්ත්‍රාත්තුවේ අතුරු ගෙවීම් සහතික අංක 20 දක්වා වන ගෙවීම් අනුව අයකර ගත යුතු සමුච්චිත ප්‍රමාද ගාස්තුව රු.3,634,307 ක් වූ නමුත් 2024 දෙසැම්බර් 31 දින දක්වාත් එය අයකර ගෙන නොතිබුණි. ඉදිරිපත් කර තිබුණු අවසන් බිල්පත වූ අතුරු ගෙවීම් පත් 20 ට අනුව ඉටුකර තිබුණු අතිරේක වැඩ වටිනාකම රු.8,358,049 ක් වුව ද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාර ව නිසි අනුමැතිය ලබාගෙන නොතිබූ අතරම විශේෂ මිල විශ්ලේෂණ ද (SSR), විධිමත් විචලතා ඇණවුම් ද (Formal variation Orders) ඉදිරිපත් කර නොතිබුණි. විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ඩීසල් විදුලි ජනන යන්ත්‍රය සපයා සවිකර නොතිබීම, ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය සම්පූර්ණ නොකිරීම, ශබ්ද පරිපාලන පද්ධතිය සම්පූර්ණ නොවීම, ජල ටැංකි හා ජල මෝටරය සම්බන්ධිත පද්ධතිය ක්‍රියාත්මක නොවීම හා විදුලිය හා ගිනි ආරක්ෂණ පද්ධතිය 2025 අගෝස්තු මස වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබීම යන ප්‍රධාන අඩුපාඩු පැවතුණි. තවද ඉදිකිරීම් ප්‍රමිතියෙන් බැහැර වීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිකිරීම් පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොකිරීම නිසා ඉදිකිරීම් දෝෂ 20 කට අධික සංඛ්‍යාවක් පැවතුණි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස කොන්ත්‍රාත්කරුට අවස්ථා කිහිපයක දී දැනුම් දී තිබුණු නමුත් එම අඩුපාඩුවලින් කොටසක් නිවැරදි කිරීමට කටයුතු කර තිබුණු අතර, ඇතැම් අඩුපාඩුවල නිවැරදි කිරීම්ද නිසි පරිදි ඉටුවී නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කිරීමට පෙර කොටස් වශයෙන් නිම කර තිබුණු ඉදිකිරීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වරින් වර භාවිතයට ගැනීම සිදුකර තිබුණු අතර, කොන්ත්‍රාත්තුව දෙපාර්ශවයේ ම එකඟතාවයෙන් නීත්‍යානුකූලව අවසන් කිරීමට (Mutual	මේ වන විට සම්පූර්ණ ගොඩනැගිල්ලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කොටසක් ලෙස පරිහරණය කරනු ලබන බැවින් ගොඩනැගිල්ල භාවිතයට ගත් කාලසීමා සලකා උපදේශන ආයතනය විසින් ප්‍රමාද ගාස්තුවක් අයවීමට ඇති නම් ඒ සඳහා සුදුසු ගණනය කිරීමක් කිරීම සුදුසු බව, උපදේශන ආයතනය විසින් අදාල නිර්දේශ ලබා දී ප්‍රසම්පාදන මණ්ඩලය අනුමැතිය ලබා ගත යුතු බව හා මෙම අඩුපාඩු සකස් කිරීම උපදේශණ ආයතනයේ නිර්දේශ මත සිදු විය යුතු බව හා මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් හා උපදේශන ආයතනය අතර මේවන විටද සාකච්ඡා කෙරෙමින් පවතින බවත් එම සාකච්ඡා හා උපදේශන ආයතනයේ නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීම යෝග්‍ය බව.	මෙම කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඉතිරි වැඩ නිම කිරීම සහ නීත්‍යානුකූල ලියකියවිලි ලබා ගැනීම සිදු කර ගත යුතු අතර, අදාළ වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.

	Termination) තීරණය කර තිබුණ ද 2025 මැයි මාසය වන විටත් එය සිදුකර නොතිබුණි.		
(ආ)	බේරුවල, හොරණ බණ්ඩාරගම, පානදුර, අගලවත්ත, දොඩංගොඩ, මතුගම හා කළුතර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ විවිධ ප්‍රතිපාදන මූලාශ්‍ර මගින් ලද රජයේ අරමුදල් මගින් ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කර එකතුව පිරිවැය රු. 42,884,718 ක් පමණ දරා අදාළ ගොඩනැගිලිවල ඉදිකිරීම්වලින් කොටසක් පමණක් නිමකර දීර්ඝ කාලයක් තිස්සේ ඉදි කිරීම් සම්පූර්ණ කිරීමකින් තොරව පවතින ගොඩනැගිලි 27 ක් හා එලෙස කොටස් ඉදිකිරීම් සඳහා වැය කළ පිරිවැය සොයාගත නොහැකි තවත් අර්ධ වශයෙන් නිමි ගොඩනැගිලි 04 ක්ද පැවතුණි. මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් ආරම්භ කර මේ වන විට වසර 02 සිට 26 දක්වා කාලසීමාවක් ගත වී තිබුණු අතර මෙම ඇතැම් ඉදිකිරීම් අත්තිවාරමට සහ කුලුණු සඳහා යෙදූ වානේ කම්බිවලට පමණක් සීමා වී තිබූ අතර එම කොටස් ද දීර්ඝ කාලයක සිට අව් වැසිවලට නිරාවරණය වී පැවතීම හේතුවෙන් ඒවා නැවත භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව තිබීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රජයේ මුදල් නිශ්කාර්ය බවට පත්ව තිබුණි.	මෙම බොහෝ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේවායේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇති බව හා පසුව ඒ සඳහා ප්‍රතිපාදන වෙන් ව නොමැති බව.	නිම නොකර අත්හැරදමා ඇති අර්ධ නිමි ගොඩනැගිලිවල ඉතිරි වැඩ නිමකර ඒවායින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුවිය යුතු අතර අවශ්‍යතාවය පිලිබඳ නිසි ප්‍රමුඛතා පෙළගැස්වීමකින් මෙන්ම නිසි ශක්‍යතා අධ්‍යයන වලින් තොරව ඉහත ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යෝජනා ඉදිරිපත්කල හා අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය.
(ඇ)	අංක 408-02-03-08 දරන වැය ශීර්ෂය යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය හා සාම්ප්‍රදායික ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ ජාතික ශිල්ප සභාව මගින් වේවැල් පුහුණු මධ්‍යස්ථානයක් හා අමුද්‍රව්‍ය බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා 2021 සහ 2022 වර්ෂවල ලබා දී තිබුණු රු.4,365,000 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන 2022 දෙසැම්බර් 31 දින වන විට එම ගොඩනැගිලිවල ඉදිකිරීම්වලින් කොටසක් පමණක් නිමකර තිබුණි. මෙහි ඉතිරි ඉදිකිරීම් සඳහා 2023 වර්ෂයේ දී රු.7,500,000 ක් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙන් කර තිබුණ ද 2023 දෙසැම්බර් 15 දිනට පෙර ව්‍යාපෘති ඉදිකිරීම් ආරම්භ කර නිම කිරීමේ හැකියාවක් නොමැති බව පවසමින් එම ප්‍රතිපාදන ප්‍රතික්ෂේප කර 2024 වර්ෂය වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම් සඳහා 2024 වර්ෂයේ දී ජාතික ශිල්ප සභාව විසින් රු.9,900,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද එකී ප්‍රතිපාදන	කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිසි කලට ප්‍රතිපාදන ලබා නොදීම, 2024 වර්ෂයේ අවසාන කාල සීමාව තුළ ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඉදිකිරීම් ආරම්භ කර අවසන් කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් නොතිබීම වැනි හේතු මත මෙහි කටයුතු 2024 වර්ෂය තුළ දී ද අපේක්ෂිත පරිදි අවසන් කළ නොහැකි වූ බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍යතාවය පිලිබඳ නිසි ප්‍රමුඛතා පෙළගැස්වීමකින් මෙන්ම නිසි ශක්‍යතා අධ්‍යයන වලින් තොරව මෙම ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යෝජනා ඉදිරිපත්කල හා අනුමැතිය ලබාදීම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කලයුතු අතර ප්‍රතිපාදන නියමිත පරිදි ලැබී තිබියදීත් අදාළ ඉදිකිරීම් නියමිත කාලසීමාව තුළ නිමකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ද වගකිවයුතු පාර්ශවයන්ට පියවර ගත යුතුය.

	උපයෝගී කරගෙන අදාළ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ දී ද නිම කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ඈ)	හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ අවසන් අදියර 2011 වර්ෂයේ වැඩ ආරම්භ කර රු.32,435,820 ක වියදමින් 2015 වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු අතර, නැවත 2016 වර්ෂයේ රු.1,996,502 ක පිරිවැයක් යටතේ වැඩ අවසන් කිරීම සඳහා අමතර වැඩ කොටසක් ද ඉටු කර 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට කාර්යාල කටයුතු සඳහා භාවිතයට ගෙන තිබුණි. ගොඩනැගිල්ල සාදා නිම කර කෙටි කාලයක් ගතවීමේ දී මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වල දෝෂ රාශියක් ඇතිවී ගොඩනැගිල්ල භාවිතයේ දී ගැටළු රාශියකට මුහුණ දීමට සිදු වී තිබුණු අතරම කොන්ත්‍රාත්කරු වෙත අවස්ථා 04 ක දී මෙම අඩුපාඩු නිවැරදි කරන ලෙස සිහිකැඳවීම් යවා තිබුණ ද ඔහු එම දෝෂ නිවැරදි කිරීමට 2025 මාර්තු දක්වා කටයුතු කර නොතිබුණි. එසේ වුවද මෙම කොන්ත්‍රාත්කරුට නැවතත් කොන්ත්‍රාත් ලබා දී තිබුණු අතරම නව ගොඩනැගිල්ලේ ඉහළ මහලේ දේශන ශාලාවට අතුරන ලද වර්ග මීටර් 7.7 ක ප්‍රමාණයක ටයිල් ගැලවී යාම හේතුවෙන් 2023 වර්ෂයේ දී රු.803,290 ක් වැය කර නැවත ටයිල් අතුරා තිබුණි. ඉදි කිරීම් නිමකර ඉතා කෙටි කාලයක දී ඉහත පරිදි දෝෂ ඇතිවීම නියමිත ප්‍රමිතීන්ගෙන් බැහැරව ඉදිකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කරුවන්ගේ හා අධීක්ෂණ නිලධාරීන්ගේ අඩුපාඩු හේතුවෙන් ඇති වූ දුර්වලතා වන අතර විශේෂයෙන් මළාපවාහන පද්ධතිය හා ජල පවාහන පද්ධතියේ දෝෂ කඩිනමින් නිවැරදි කළ යුතුව පැවතුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිකිරීම් ප්‍රමිතියෙන් තොර අඩුපාඩු සහිතව නිම කළ කොන්ත්‍රාත්කරුවන්හට එරෙහිව පියවර ගැනීමටත්, මෙම වැඩ අධීක්ෂණයට ලක් කළ නිලධාරීන් සම්බන්ධයෙන් ද නිසි ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.
(ඉ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 04 ක අයිතිය පවරාගෙන නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී ඇති මෝටර් බයිසිකල් 15 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම් අපොහොසත් වී තිබුණි. කළුතර දිස්ත්‍රික් ලේකම් නමින් ඇති මෝටර් බයිසිකල් 05 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ආපදා ඒකකය වෙත අනුයුක්ත කර තිබුණ ද එම මෝටර් බයිසිකල් සඳහා වූ දෛනික ධාවන සටහන් මාසිකව එකී ආයතන වෙතින් විගණනයට	මෙම වාහන 04 දිස්ත්‍රික් ලේකම් කළුතර නමට ලියාපදිංචි අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බවත්, යතුරු පැදි සම්බන්ධයෙන් කොම්ට්‍රෝලර් ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කරන බවත්, යතුරුපැදි 03 සඳහා ආදයම් බලපත්‍ර නිකුත් නොකරන ලෙස හා අසාධු ලේඛන ගත කරන ලෙස පළාත් ආදායම් මෝටර් රථ කොමසාරිස් වෙත දන්වා ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නමින් ලියාපදිංචිව ඇති සියලු වාහනවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීමට දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කළ යුතු අතර, විධිමත් සම්බන්ධීකරණයක් පවත්වා වත්කම්වල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කරන

	ඉදිරිපත් කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී තිබූ ට්‍රැක්ටර් 05 ක් සහ බවුසර් ට්‍රේලර් 07 ක් දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර තිබුණ ද ඒවා භාවිතා නොකරනු ලබන බවත්, විවිධ අවස්ථාවල දී ඒවා ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා වෙත ලබා දී ඇති බවත් එම ට්‍රැක්ටර් සහ බවුසර් ට්‍රේලර් එම ප්‍රාදේශීය සභා විසින් භාවිතා නොකරන බවත් දැනට ඒවායේ අවශ්‍යතාවයක් නොවන බැවින් ආපසු ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම් වෙත බාරදීමට ඉල්ලීම් කර තිබුණ ද මේ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය සිදු කර භාර ගැනීම කර නොතිබුණි.	දිස්ත්‍රික් ආපදා ඒකකය වෙත ලබා දී ඇති යතුරුපැදි වලට අදාළ සියලු දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොකරන යතුරුපැදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරදෙන ලෙසත් දන්වා ඇති බවත්, මෙම ට්‍රැක්ටර් බවුසර් ප්‍රාදේශීය සභා වෙත පවරා දීමට අදාළව ඉදිරි කටයුතු කිරීමට යෝජිතව පවතින බව.	වැඩපිළිවෙලක් සැකසිය යුතුය.
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිහරණය කරනු ලබන මෝටර් රථ අලුත්වැඩියා කිරීම්වල දී ඒ සඳහා කැඳ වූ මිල ගණන් ව්‍යාජ ඒවා බවටත් ඒවා එකම ගරාජයකින් ලබාගෙන තිබූ බවටත් හෙළිදරව් වී තිබියදීත් එම ගරාජ අසාධු ලේඛන ගත නොකිරීම හා ඒ සඳහා මැදිහත් වූ වගකිවයුත්තන් සඳහා ප්‍රමාණවත් විනය ක්‍රියාමාර්ග නොගැනීම, එමෙන්ම ඉන්පසුව සිදු කළ අලුත්වැඩියා සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවල දී ඉදිරිපත් වන මිල ගණන්වල නිර්ව්‍යාජභාවය පිළිබඳ ප්‍රමාණවත් තහවුරුවක් ලබා නොගැනීම, ගරාජය විසින් අලුත්වැඩියාව සඳහා පළමුව අඩු ලංසුවක් ඉදිරිපත් කර එම ආයතනයට අලුත්වැඩියාවට රථ යොමු කළ විට වෙනත් දෝෂ පවතින බව දන්වා වැඩි මුදලකට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම අඛණ්ඩව සිදුවී තිබීම, අලුත්වැඩියා හා අමතර කොටස් යෙදීම්, ටයර් හා බැටරි යෙදීම් යනාදිය පිළිබඳ ලොග් පොත්වල සටහන් නොයෙදීම, අලුත්වැඩියා හා ටයර් යෙදීම්වල දී මෝටර් රථ පරීක්ෂක ලවා පෙර හා පසු පරීක්ෂා සිදුකරවාගෙන නොතිබීම, නියමිත දුර සීමාවන් තුල මොටර් රථවල Wheel Alignment සිදු නොකිරීම හේතුවෙන් ටයර්වල ආයු කාලය අඩුවීම ආදී පද්ධති හා පාලන දුර්වලතා රාශියක් නිරීක්ෂණය වී තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන උපයෝජනය	කැබ් රථ සිදුවීමකට අදාළ විෂය නිලධාරීන්ට අවවාද කර ඇති අතර, රියදුරු දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට කටයුතු කරන මෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති බව. රියදුරන්ට හා විෂය නිලධාරීන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇති අතර මෙම වර්ෂයේදී ඒවා පැවැත්වීමට සංවිධානය කර ඇති බව.	මෝටර් රථ අලුත්වැඩියා කිරීම්වලදී අක්‍රමිකතාවලට සම්බන්ධ සියලු නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විනය ක්‍රියාමාර්ග ගැනීමත්, එම අක්‍රමිකතාවලට සම්බන්ධ ගරාජ අසාදුලේඛණගත කිරීමත්, මෝටර් රථ උපයෝජනය සම්බ්නධ අභ්‍යන්තර පාලනය ශක්තිමක් කිරීමටත් පියවර ගත යුතුය.

	සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පිළිවෙත් නොමැති වීම මෙන්ම පවත්නා අභ්‍යන්තර පාලන පිළිවෙත් නොපිළිපැදීම සිදු වී තිබුණි.		
(උ)	“ආපදාවලින් විපතට පත් ජනතාවට නැවත පදිංචි කිරීමේ" ව්‍යාපෘතිය යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 2,975,000 ක මුදල් ආධාර ලබා දී නැවත පදිංචි කරන ලද නිවාස 02 ක් ප්‍රතිලාභීන් විසින් අත්සතු කර තිබුණ ද මෙම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දිස්ත්‍රික් ලේකම් වෙතින් උපදෙස් ඉල්ලීම හැර 2025 පෙබරවාරි වන වටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් මේ පිළිබඳව තවදුරටත් විමසා ලැබෙන උපදෙස් හා නියෝග අනුව ඉදිරි කටයුතු සිදුකරන බව.	ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා සම්බන්ධ වී මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගත යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක සිදු කල නියැදි විගණන පරීක්ෂාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 හි ම 2024 වර්ෂයේ දී තාවකාලික ගොනු 72 ක් මත රු.12,108,247 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණු අතර බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිසිදු ගොනුවක් නොමැතිව විශ්‍රාමිකයන් 20 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් රු.3,978,836 ක් ගෙවා තිබුණි. අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුමන නිලධාරියෙකු භාරයේ තිබියදී ද යනවග ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙන නොතිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් අංශයේ විශ්‍රාම වැටුප් ගොනු, විශ්‍රාමිකයා මියයාම් හෝ වෙනත් හේතු මත වෙනස් වන ගොනු, නව එකතු කිරීම් වන ගොනු ආදියට අදාළ තොරතුරු විශ්‍රාම ගොනු සම්බන්ධ ලේඛනයට ඇතුළත් කර එම ගොනු විශ්‍රාම වැටුප් නිලධාරීන්ට භාරදීමක් සහ නිලධාරීන් විශ්‍රාම යාම හෝ ස්ථාන මාරු වී යන අවස්ථාවල දී නිලධාරීන් භාරයේ පවතින ගොනු විධිමත් පරිදි භාරදීම හා භාර ගැනීම කිසිදු අවස්ථාවක සිදුවී නොතිබුණි. එම හේතුවෙන් ගොනු අස්ථානගත වීම්, ප්‍රමාණවත් ලේඛන ගොනුගත නොවීම්, සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් කවුරුන් ද	පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	විධිමත් පරීක්ෂණයක් පවත්වා අක්‍රමවත්ව කටයුතු කළ නිලධාරීන්ට පියවර ගැනීමත්, විශ්‍රාම වැටුප් ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් ඇති කිරීමටත් පියවර ගත යුතුය.

	යන්න තහවුරුවට නිසි ක්‍රමවේදයක් ස්ථාපනය වී නොතිබීම නිසා විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලකින් කටයුතු කර නොතිබුණි.		
(එ)	ගණනය කිරීමේ දෝෂ හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාම ලිපිගොනු 66 ක 2024 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු.11,102,428 ක් වූ අතර ඒවා වාරික වශයෙන් අය කර ගනිමින් පැවතුණි. ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක විශ්‍රාමිකයන් 07 දෙනෙකු මියයාම හේතුවෙන් රු.313,044 ක් අය නොවී පැවතුණි.	පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි	වැඩිපුර ගෙවීම් නොපමාව අයකරගතයුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ පරිදි විනයානුකූලව කටයුතු කළ යුතුය.
(ඒ)	ඉංගිරිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී ගන්නා ලද තීරණය පරිදි ඉංගිරිය හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පස් හා වැලි කැණීම් කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පරිසර කමිටුවේ නිර්දේශ මත අනුමැතිය ලබාදීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණි. ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත පස් හා වැලි සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ ඉදිරිපත් කරන අවස්ථාවල දී ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ පිහිටුවා ඇති පරිසර කමිටුවේ තීරණය අනුව කටයුතු කර නිර්දේශ ලබා දෙන ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා තිබුණි. එසේ වුවද 2024 සැප්තැම්බර් 12 දක්වා පස් හා වැලි කැණීම් සිදු කිරීම සඳහා අයදුම්පත් 26 ක් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබුණ ද කිසිදු අවස්ථාවක පරිසර කමිටු වාර්තා ලබාගැනීමක් සිදු කර නොතිබුණි.	අවශ්‍ය නම් ප්‍රාදේශීය පරිසර කමිටුවේ නිර්දේශ ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් ක්‍රියා කළ යුතු බව හා එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගී බැවින් එම අයදුම්පත් අනුමත කර ඇති බව.	නීතිමය විධිවිධානවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමත්, පස් හා වැලි කැණීම් කටයුතු සඳහා බලපත්‍ර ලබාදීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පරිසර කමිටුවේ නිර්දේශ මත අනුමැතිය ලබාදීමත් කළ යුතුය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(ඔ)	කළුතර දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී පළාත් පාලන ආයතනවලින් පවරා ගත යුතු ඉඩම් හා පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් හඳුනා ගෙන නිවරදිව පවරාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී තිබුණ ද නියැදි පරීක්ෂාවට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් කට්ටි 73 ක පැවරුම් කටයුතු සිදු කර නොතිබුණි.	පළාත් පාලන ආයතන වලින් පවරා ගත යුතු ඉඩම් හා පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් හඳුනා ගෙන නිවරදිව පවරාදීමට කටයුතු කරන බව.	පවරා ගත යුතු සහ පැවරිය යුතු රජයේ ඉඩම් සම්බන්ධයෙන් කාලීනව කටයුතු කළ යුතුය.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2024 හා 2025 වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද විගණන විමසුම් 14 ක් සඳහා 2025 අගෝස්තු 15 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණු අතර, මාස 03 කට වැඩි කාලයක් ගත වුව ද පිළිතුරු ලබා නොදුන් විමසුම් ගණන 09 ක් විය.	2024 වර්ෂය සඳහා විගණන විමසුම් 61 ක් ලැබී ඇති අතර මේ වන විට 53 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර විගණන විමසුම් 08 ක් සඳහා තවදුරටත් පිළිතුරු ඉදිරිපත් කළ යුතුව ඇති බව.	විගණන විමසුම් සඳහා කාලීනව පිළිතුරු ලබාදී අදාල නිවැරදි කිරීම් සිදු කළ යුතුය.

5. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

5.1 තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණද, ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ජයග්‍රහණ දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ එම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව මැනිය හැකි නිශ්චිත දර්ශකයක් ලෙස (KPI) විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව මැනිය නොහැකි විය.	අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම සංඛ්‍යාත්මකව මැණිය හැකිවන පරිදි, නිශ්චිතව දර්ශකයක් ලෙස ප්‍රධාන කාර්යය සාධන දර්ශක (KPI) විගණනය වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය ඇගයීමට හැකිවනු පිණිස ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ජයග්‍රහණ දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ එම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව මැනිය හැකි නිශ්චිත දර්ශකයක් ලෙස (KPI) ඉදිරිපත් කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කළුතර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් සේවයේ යොදවා සිටි අතර නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක පමණක් එලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා සිටි අතිරික්ත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 80 දෙනෙකු විය.	රජයේ ප්‍රතිපත්තියක් මත ගන්නා ලද තීරණයක් අනුව එම නිලධාරීන් බඳවාගෙන අනුයුක්ත කර ඇති බව.	අනුමත කාර්ය මණ්ඩලයට අනුකූලව තනතුරු පවත්වාගෙන යාමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට කටයුතු කිරීම.